ඇලෙක්සි ලැප්තෙව්

ඇලෙක්සි ලැප්තෙව්

අනුවාදය

සුනිල් අභයවීර

Kanol

එකයි දෙකයි තුනයි

කතාව සහ චිත්‍ර
ඇලෙක්සි ලැප්තෙව්

අනුවාදය
සුනිල් අභයවීර

නව පරිගණක සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-13-3

ප්‍රකාශනය

කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
රොනැට් එන්ටප්‍රයිසස්

ප්‍රථම මුද්‍රණය 2010

පැණි පෙරේනව හරි සුවඳයි
වලස් පැටිය පැණි කනවා
පැණි වෙනුවට - කට ඇතුළට
මී මැස්සෝ රිංගනවා

තණ බිස්සෙන්
රැහැයියෝ
හඬ නැගුවා
ඒ සමගම තණ පෙත්තෝ
පොඩි වීණා වැයුවා

පාන්දරින් නැගිටලා
බැද්ද දිගේ පැන පැන ගොස්
බෝවිටියා ගෙඩි කනවා
ගෙඹි පැටවුන් තුන්දෙනා

පාන්දරින් කැලේට ගොස්
මල් නොතලා
කොළ නොකඩා පිනි
බොන්නට ආසයි මම

පොඩි හුළඟක් හැමු විගසින්
තණකොළ මල් සෙලවුණ විට
දඩිබිඩි ගා පැන දුවන්නෙ
දිග කන් ඇති-ලොකු ඇස් ඇති
ලස්සන පොඩි හා පැටවුන්



කුරුමිණියෙකු වට කරගෙන
තාර පැටව් ටොකු අනිනව
කුරුමිණියා අඬු දිගු කොට
පෙරටම යයි සටන් බිමට

එන්න එන්න මා ළඟට
මා දැන් ලොකු කුකුළෙක්
මගේ හොටෙන් ඇනපු ගමන්
පුංචි ඔබ කෑ ගසාවි

වටු පැටියගෙ ඔලුව වටේ
බත් කූරෙක් කැරකෙනවා
කටට වැටෙන තුරු ඒකා
කට ඇරගෙන බලා සිටී

බට්ටිච්චෝ ගොදුරු කන්න
පොරකෑවා බබ්බු වගේ
මිනිත්තුවෙන් ඒ දබරය
පෙරළුණානෙ විහිලුවකට

බිලි පිත්තක් අතින් රැගෙන
මාලු බාන්නෙක් ඇල ළඟ
දවල් බතට, කිරි හොද්දට
මාලු ටිකක් අල්ල ගන්ට
පැය ගාණක් දුක් විඳිනව.

වැහි කාලෙට අපේ සෙවන
ලොකු ලොකු මේ හතු විතරයි
මොර සූරන මහ වැස්සේ
හතු යට අප ලැග ගන්නේ.

පවන වගේ දුවනවා
වඳුරා වගේ පනිනවා
පුංචි පැටිය පැන පැන යයි
කුරුලු පැටව් මල් ගෙන යයි.



රුවැති, හැඩැති
අස්ස පැටව්
බෙර තාලෙට
නට නට යති.

තාර පැටව් කඹ අදින්ට
පනුවෙක් අහුලා ගත්තා
කඹේ කැඩිලා
දෙන්නා වැටිලා.



















Kanol

Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 011 4336779

ISBN 978-955-1979-11-9
Rs. 130/-
9 789551 979119